# සෙබළු සිතුවිලි දෙසතිය

2025
ඔක්තෝබර්
01 - 15

වෙළුම
LI

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශණයකි



# රණවිරුවා

ජීවිතය ආදරය
ඈත සිට අතවනයි
මැණියන් පෙම්වතිය
දුරට වී පෙම් බඳියි
පතිනිය ද පුංචිපුතු
ලගට වී ඉකි බිඳියි
වීරපුතු යොවුන් විය කැප කරන්
යුද බිමක අවි දරයි

ලා/කෝ චින්තක ජේවීසී
8 විපාරෙ



# සැබෑ මිනිසෙකු වන්නේ

සැබෑ මිනිසෙකු වන්නේ
පෙළපත් නාමය හෝ
ඇඳුමට විතරක් නොව
හදවතින් නැගෙන
යහපත් සිතුවිලි තුලිනුයි
චරිතය තුලින්
ගෞරවය අගෞරවය
ලැබෙනවා සේම
මනුස්සකම ඇති
මිනිසෙකු බිහිවෙන්නේ
හදවතින් නැගෙන
යහපත් සිතුවිලි තුලිනුයි



**කෝප්‍රල් ලංසකාර එල්එච්එන්කේ**
**4 විපාරෙ**

# යුධ බිමේ ආදරය

කාටවත් නොකියා හිතේ තද කරගෙන
තනියම දරාගෙන ඉන්න දුකක්
වේදනාවක් හමුදාවේ කොල්ලෙක්ගෙ
ජීවිතේ අස්සෙන් තියෙනවා

නිවාඩුව අවසන් වන දිනේ
හදෙහි සන්තාප ගොඩනැගේ
පතිනි තනිකර යන දිනේ
සෙබළ සිත් වාවනු කෙසේ

රාජකාරිය දේවකාරියලෙසේ
ඉටු කිරීමයි සෙබළගෙ වගකීම උනේ
ආදරේ කැප කරන් යොවුන් විය
සෙබළ නැවතුම කදවුරයි දිවිතුරේ



පා/සෙ කුමාර ආර්ඩියුපී
8 විපාරෙ

# ආදරය

නෙතට වදදෙන
හිතට දුක්දෙන
අමතක කර ගැනීමට
නොහැකිව ලතවෙන
නුබට පෙම්බැඳි
මගේ ආදරය

පා/සෙ වර්ණසූරිය ඩබ්එම්එන්එස්පී
8 විපාරෙ





# මිතුරිය

බැඳීමකි සසරින් සසර පතනා
පසුපසින් එන සෙනෙහෙ සිතනා..
ඔබගේ හද තුල නිතර වෙසෙනා
මිතුරියයි මා සොහොයුරිය මවනා...


යෙහෙළියයි ඔබ මගේ හද තුල
සොහොයුරිය වන විටදී නෙත තුල...
මවද වේ නොදැනීම හිත තුල
මිතුදමකි මේ හැඟීම් දනවන.....

යළිදු කෙළෙසක හමුවේද අප
කොතැන සිටියත් මතක් වේ මට..
ප්‍රවේසම් වි සිටිනු මිතුරිය
දළඳා පිහිටයි මගේ මිතුරි හට.....

කෝප්‍රල් පින්ශාරිකා ඩබ්ලිව්ඒපී
11 ශ්‍රීලංසංබ

# ජීවිතයේ සැබෑ සතුට

ලෝකයට පෙනෙන්නට පමණක්
ඔබ හොඳ මිනිසෙකු නොවන්න
මන්ද ඔබගේ හෘද සාක්ෂියට
ඔබට බොරු කිරීමට නොහැක
මොන දේ ලැබුනත්
නිලතල බලතල කොපමණ තිබුණත්
ඒ තුලින් ලැබෙන්නනේ
තාවකාලික සතුටක් පමණි
පිවිතයේ සැබෑ සතුට රදා පවතින්නේ
තම හෘද සාක්ෂියට අනුව
බොරුව නොකර යහපත් සිතිවිලි එක්ක
මනුස්සකමින් ජීවත් වීම තුලය



ලා /කෝ චින්තක ජේඒසී
8 විපාරෙ




ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය | www.army.lk | 011 2076967